ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
Department of Examinations, Sri Lanka
NATIONAL EVALUATION AND TESTING SERVICE
පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை, பத்தரமுல்லை
Pelawatta, Battaramulla.

මගේ අංකය / எனது இல / My No: 6/6/උ.පෙළ/2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதි / Date: 2023.01.0?

දුරකථන / தொலைபேசி / Telephones: 2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206,
අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Internet Address: www.doenets.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2785220
තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503, කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O.Box 1503 Colombo
E-mail : examd@sltnet.lk

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
8 වන මහල,
ලංකා බැංකු වෙළඳ කුළුණ,
කොළඹ 03.

PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA
10-30 am.
10 JAN 2023
181.

**අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2022(2023) පැවැත්වෙන කාලය තුළ විදුලිය විසන්ධි කිරීම සම්බන්ධවයි.**

උක්ත විභාගය සඳහා විභාග අපේක්ෂකයින් 331709 දෙනකු වෙනුවෙන්, දිවයින පුරා විභාග මධ්‍යස්ථාන 2200කදී 2023 ජනවාරි මස 23 දින සිට 2023 පෙබරවාරි මස 17 දින දක්වා පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

02. විභාගය පැවැත්වෙන කාලය තුළ විදුලිය විසන්ධි කිරීම් හේතුවෙන් විභාගය සඳහා පෙනී සිටින විභාග අපේක්ෂකයන් දැඩි දුෂ්කරතාවයකට පත්වන බව මා වෙත වාර්තා වී ඇති අතර මෙම තත්ත්වය හේතුවෙන් විභාගය නියමිත පරිදි පවත්වාගෙන යාමට බාධාවක් වී ඇත.

03. ඒ අනුව, මේ සමඟ අමුණා ඇති විභාග කාලසටහනේ දැක්වෙන විභාගය පැවැත්වෙන කාලයන් තුළ විදුලිය විසන්ධි කිරීම් නොකරන ලෙස කාරුණිකව ඉල්ලමි. (විභාග මධ්‍යස්ථාන ඇතුළත් ලේඛනයද මේ සමඟ එවමි.)

04. තවද, උසස් පෙළ විභාග අපේක්ෂකයින් විභාගය සඳහා සූදානම් වන රාත්‍රී කාලයේද විදුලි විසන්ධි කිරීම හේතුවෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බව ද මා වෙත බොහෝ පැමිණිලි වාර්තා වී ඇත. එබැවින් රාත්‍රී කාලයේද විභාගය අවසන් වන 2023 පෙබරවාරි මස 17 වන දින දක්වා විදුලි විසන්ධි නොකිරීම කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කර දරුවන්ට අපහසුතාවයක් නොවන පරිදි කටයුතු කරන මෙන් තවදුරටත් කාරුණිකව ඉල්ලමි.

05. උක්ත විභාගය බාධාවකින් තොරව, සාර්ථකව පැවැත්වීම සඳහා ඔබ හා ඔබ ආයතනය ලබා දෙන සහාය අතිශය අගය කරමි.

එච්.ජේ.එම්.සී.ඒ. ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

Dareesa
Talk to me on this
10/01/23

පිටපත : ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - කරු. දැ.පි.